ඌව පළාත් සභාව
ஊவா மாகாண சபை
Uva Provincial Council

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුබසාධන අමාත්‍යාංශය
சுகாதார, சுதேச வைத்திய, நன்னடத்தை சிறுவர் பராமரிப்பு, மகளிர் விவகார மற்றும் சமூக நலன்புரி அமைச்சு
Ministry of Health, Indigenous Medicine, Probation And Childcare, Women Affairs and Social Welfare

301, ආර්.එච්. ගුණවර්ධන මාවත, බදුල්ල. 301, ஆர்.எச். குணவர்தன மாவத்தை, பதுளை. 301, R.H. Gunawardene Mawatha, Badulla.


මගේ අංකය / எனது இல. / My No. } 5/ES/6/3-01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2026.05.04

ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ඌව පළාත් ආයුර්වේද කොමසාරිස්,
ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, බදුල්ල / මොණරාගල,
ඌව පළාතේ සියලුම මූලික රෝහල් වෛද්‍ය අධිකාරිවරුන්,

**<u>ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා / ආයුර්වේද/ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවල PL-01/PL-02 හා PL-03 කාණ්ඩවලට අයත් දෙපාර්තමේන්තුගත තනතුරුවල III වන, II වන හා I වන ශ්‍රේණිවල සේවයේ නියුතු නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ- 2026</u>**

ඌව පළාත් සභාවේ සෞඛ්‍ය සේවා, ආයුර්වේද , පරිවාස හා ළමාරක්ෂක සේවා යන දෙපාර්තමේන්තුවල PL-01/ PL-02 හා PL-03 කාණ්ඩයන්ට අයත් දෙපාර්තමේන්තුගත තනතුරුවල III වන, II වන හා I වන ශ්‍රේණිවල සේවයේ නියුතු නිලධරයන් සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටිවලට අනුකූලව පැවැත්වීමට නියමිත වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ 2026 ජූලි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ සඳහා ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ආයුර්වේද දෙපාර්තමේන්තුව, සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල දෙපාර්තමේන්තුගත තනතුරුවල සේවයේ නියුතු PL-01, PL-02 සහ PL-03 වැටුප් කාණ්ඩවල නිලධරයන්ට පමණක් ඉල්ලුම් කළ හැකි අතර, අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ බදුල්ල නගරයේ දී පමණක් පවත්වනු ලැබේ.

03. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන්ට අදාළ විස්තරාත්මක නිවේදනය www.healthmin.up.gov.lk යන අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර, අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ exam.healthmin.up.gov.lk වෙබ් සබැඳිය මගින් අයදුම් කළ යුතු ය.

04. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2026.05.20 වන අතර, මාර්ගගත ක්‍රමය මගින් අයදුම් කරන නිලධරයන් අදාළ අයදුම්පත මාර්ගගත ක්‍රමය මගින් අයදුම් කර එහි දෘඩ පිටපතක් ආයතන ප්‍රධානියා සහ පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන ආයතනයේ ප්‍රධානියා මගින් 2026.05.31 දිනට පෙර මෙම අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු ය.

05. මේ සම්බන්ධයෙන් ඔබ දෙපාර්තමේන්තුවේ /ආයතනයේ සේවය කරන නිලධරයන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, නියමිත දිනට පෙර අයදුම්පත් යොමු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

එච්.එම්.ජීවන්ත හේරත්
ලේකම්

පිටපත: ඌව පළාතේ ප්‍රධාන ලේකම් - කා.දැ.ගැ.ස


| | | | |
|---|---|---|---|
| ලේකම් / செயலாளர் / Secretary } 055-4936288 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / சிரேஷ்ட உதவி செயலாளர் / Senior Assistant Secretary } 055-4936300 | අධ්‍යක්ෂ (සැලසුම්) / பணிப்பாளர் (திட்டமிடல்) / Director (Planning) } 055-4936297 | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant } 055-4936293 |
| සහකාර ලේකම් (පාලන) / உதவி செயலாளர் (நிர்வாகம்) / Assist.Secretary (Admin) } 055-4936292 | සහකාර ලේකම් (ආයතන) / உதவி செயலாளர் (தாபன) / Assist. Secretary (Est.) } 055-4936289 | සහකාර ලේකම් (වෛද්‍ය) / உதவி செயலாளர் (வைத்திய) / Assist. Secretary (Medical ) } 055-4936291 | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer } 055-4936290 |
| පොදු දුරකථන / பொது தொலைபேசி / General Tele. } 055-2222803 / 055-4936287 | ෆැක්ස් / தொலைநகல் / Fax } 055-2224325 | විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / Email } healthupc@gmail.com | https://healthmin.up.gov.lk |